**සෙනෙවිරත්න, ආර්. ඒ. එස්.**
PAPER

**විශ්වවිද්‍යාල සිසුන් පර්යේෂණ සඳහා යොමුවීම පිළිබඳ අධ්‍යයනයක් : කොළඹ, කැලණිය හා රුහුණ විශ්වවිද්‍යාල ඇසුරින්**

ආර්. ඒ. එස්. සෙනෙවිරත්න, රුහුණ විශ්වවිද්‍යාලය

විශ්වවිද්‍යාලය යනු උසස් අධ්‍යාපන ආයතනයක් මෙන්ම උපාධි අපේක්ෂකයන් හා පශ්චාත් උපාධි අපේක්ෂකයන් සඳහා විවිධ විෂය මාලාවන්ට අදාල ශාස්ත්‍රීය උපාධි පිරිනමන පර්යේෂණ ආයතනයක් ද වේ. (Wikipedia Encyclopedia) තවත් ආකාරයකින් කිවහොත් විශ්වවිද්‍යාලය යනු සත්‍ය ගවේෂී ආයතනයකි. එය පර්යේෂණ සහ ඉගැන්වීම් කරන ආචාර්යවරුන් මෙන්ම එකී ආචාර්යවරුන්ගේ මාර්ගෝපදේශකත්වයෙන් දැනුම හා හික්මීම ද ලබන ශිෂ්‍යයන්ගෙනුත් යුක්තය. ඒ අනුව විශ්වවිද්‍යාලයක ප්‍රධාන අංගය වන්නේ පර්යේෂණ පැවැත්වීමයි. එය ආචාර්යවරුන් සඳහා පමණක් නොව උපාධි අපේක්ෂක සිසුන්ගේ ද කාර්යකි.

එබැවින් විශ්වවිද්‍යාල සිසුන් පර්යේෂණ සඳහා යොමුවීම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි මූලික අරමුණයි. පර්යේෂණ පිළිබඳ සිසුන් තුළ ඇති අවබෝධය, දැනට පර්යේෂණ සඳහා ඔවුන් ලබා දී ඇති දායකත්වය, පර්යේෂණ සිදු කිරීම සඳහා ආචාර්යවරුන් ලබාදෙන මග පෙන්වීම, පර්යේෂණ සඳහා යොමු වන විට දී ඇතිවන බාධා හා ගැටලු මොනවාද යන්න පිළිබඳ සෙවීම මෙහි සෙසු අරමුණු වේ.

පර්යේෂණ නියදිය සඳහා කොළඹ, කැලණිය හා රුහුණ යන විශ්වවිද්‍යාලයන් හි විද්‍යා, කලා සහ වාණිජ යන පීඨවල පළමු වසරේ සිට සිව්වන වසර දක්වා සිසුන් නියෝජනය වන පරිදි යොදා ගැනේ. මෙහි දී භාවිත පර්යේෂණ ක්‍රමය සමීක්ෂණ ක්‍රමයයි. දත්ත එකතු කිරීම සඳහා ප්‍රශ්නාවලී සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගන්නා ලදී.

මෙම අධ්‍යයනයේ දත්ත විශ්ලේෂණය තුළින් අනාවරණය වූ ප්‍රධාන කරුණ වූයේ සිසුන් වැඩි පිරිසක් පර්යේෂණ යන්න පිළිබඳ නිසි දැනුවත්භාවයක් නොමැති බවයි. විශ්වවිද්‍යාල අධ්‍යයන කටයුතු හැර පර්යේෂණ සඳහා දායකත්වය ලබා දී නොමැති බව ද වැඩි පිරිසකගේ ප්‍රතිචාරය විය. එහෙත් මෙම ප්‍රතිචාරයේ දැකිය හැකි විශේෂත්වය වූයේ සිව්වන වසර සිසුන් පමණක් යම්කිසි පර්යේෂණයක් සඳහා දායකත්වය ලබා දී ඇති බවය. එසේම ආචාර්යවරුන් විසින් විශ්වවිද්‍යාල සිසුන් පර්යේෂණ සඳහා යොමු කිරීම සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන බව ද වැඩි දෙනෙකුගේ ප්‍රතිචාරය විය. විශේෂයෙන්ම අර්ධ වාර්ෂික (Semester) ක්‍රමය නිසාත්, පන්ති සාමාර්ථයන් ලබා ගැනීම යන ඉලක්කයන් හේතුවෙන් විභාගවලට අවධානය යොමු කිරීම නිසා අධ්‍යයන කටයුතු අතරතුර පර්යේෂණ සඳහා යොමු වීමට කාලය නොමැතිකම, පර්යේෂණ පිළිබඳ පුළුල් අවබෝධයක් හා නිසි මග පෙන්වීමක් නොමැතිකම, මූල්‍යමය හා ද්‍රව්‍යමය පහසුකම් ප්‍රමාණවත් නොවීම, ආචාර්යවරුන්ගෙන් ලැබෙන සහයෝගය ප්‍රමාණවත් නොවීම යනාදිය ද ප්‍රතිචාරවලින් නිගමනය විය.

ඉහත නිගමන අනුව විශ්වවිද්‍යාල විෂය මාලාවන් තුළ පර්යේෂණ සඳහා වැඩි ඉඩ ප්‍රස්තාවක් ලබාදීම, පර්යේෂණ විධික්‍රම (Research Method) විෂයක් ලෙස විශ්වවිද්‍යාල සිසුන්ට හැදෑරීමට අවකාශය උදා කරදීම, පර්යේෂණ පිළිබඳ නිසි අවබෝධයක් ලබාදීම හා ඒ සඳහා මග පෙන්වීම, ආචාර්යවරුන් විසින් සිසුන් පර්යේෂණ සඳහා යොමු කරවීමට උනන්දු කරවීම හා දිරි ගැන්වීම යනාදිය යෝජනා ලෙස ඉදිරිපත් කළ හැකිය.